


# බ්‍රිතාන්‍යයන් යටතේ නිලතල හෙබ වූ මාතර ප්‍රභූවරු (1823-1900)

මහාචාර්ය අනුර මනතුංග

මෙම ලිපියෙන් මා අවධානය යොමුකොට ඇත්තේ 1823-1900 අතර කාලය තුළ මාතර දිස්ත්‍රික්කය පාලනය කළ දේශීය ප්‍රභුවරුන් පිළිබඳවය. මෙහි දී 1823 වර්ෂය ආරම්භක වර්ෂය ලෙස ගෙන ඇත්තේ එම වර්ෂයට පෙර කාලයට අදාළ මූලාශ්‍ර මෙතෙක් පරිශීලනය කළ නොහැකි වූ නිසා මිස වෙනත් විශේෂ හේතුවක් නිසා නොවන බව කිව යුතුය. එහෙත් 1899 වර්ෂය මෙහි අවසන් වසර වශයෙන් ගනු ලැබුවේ එය ශතවර්ෂයක අවසානය සනිටුහන් කරන බැවිනි.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භයේ සිට මාතර දිස්ත්‍රික්කය පාලනය වූයේ දකුණු පළාත භාරව ගාල්ලේ සිටි ඒජන්තවරයා මගිනි. එම තනතුර හැමවිටම සුදු ජාතිකයෙකු විසින් හොබවනු ලැබූ අතර ඔහු යටතේ තංගල්ලේ සිටි කලෙක්ටර්වරයා විසින් ද පසුව මාතර සිටි උප ඒජන්තවරයා විසින් ද මාතර දිස්ත්‍රික්කය පාලනය කරනු ලැබීය. එම නිලධාරීන් වශයෙන් හැමවිට ම පත් කරනු ලැබුවේ ද සුදු ජාතිකයන්මය. එහෙත්, ඔවුන් යටතේ කච්චේරියේත් දිස්ත්‍රික්කයේත් පාලන කටයුතු සඳහා දේශීය මූලාදෑනීහු පිරිසක් පත්වීම් ලැබූහ. ඉංග්‍රීසීන්ගේ විශ්වාසය දිනා ගත් දේශීය ප්‍රභූන් අතරින් තෝරා ගත් මෙම පිරිස විශේෂ හේතුවක් නොවී නම් දිවි ඇති තෙක් එම තනතුරු හෙබවූහ. බොහෝවිට එම තනතුරු එකම පවුල හෝ පවුල් කීපයක් අතර හෝ බෙදී ගියේය.

1823 වන විට මාතර සිටි ප්‍රමුඛතම දේශීය ප්‍රභුවරයා වූයේ දොන් ඩේවිඩ් ජයතිලක අබේසිරිවර්ධන ඉලංගකෝන් වාසල මහමුදලිතුමාය. එතුමා, එම පදවිය හැරුණු විට, රජයේ ප්‍රධාන තෝල්ක මුදලි තනතුර ද දැරුවේය. ඔහු මාතර, හතර තොටමුණේ මුදලි පදවියත් ගජනායක මුදලි පදවියත් ඇතුළු තවත් තනතුරු රැසක්ම හෙබවීය. එකල මාතර කච්චේරියේ මොහොට්ටි මුහන්දිරම් තනතුර සහ දෙවැනි තෝල්ක මුදලි තනතුර හෙබවූයේ ජොහැන්නස් රැලිගු විජේරත්න සිරිවර්ධන මුදලිතුමා වන අතර මාතර දිස්ත්‍රික්කයේ මුදලි තනතුර දොන් ජුවන් අබේවර්ධන ඉලංගකෝන් මුදලිතුමා විසින් හොබවනු ලැබීය.

මේ හැරුණු විට, ගගබඩපත්තුව, වැලිගම් කෝරළේ සහ වැලිගම් තොටමුණ, මොරවක් කෝරළේ සහ කොළොන්න, කඳුබොඩපත්තුව සහ වැල්ලබඩපත්තුව යන මුදලි පේරුවලට මුදලිවරු පස් දෙනෙක් පත්කොට සිටියහ. 1823 වන විට ගගබඩ පත්තුවේ මුදලිවරයා වූයේ ජෙරාඩ් ද සරම් විජේසේකර තිලකරත්නය. වැලිගම් කෝරළේ සහ වැලිගම් තොටමුණ පැවැතියේ පේට්‍රුස් ඒබ්‍රහම් කොර්නේලිස් අබේවර්ධන ඉලංගකෝන් මුදලිවරයා යටතේය. එම කෝරළයේ මුහන්දිරම්වරයකු ලෙස දොන් හෙන්ඩ්‍රික් පෙරේරා විජේසිංහ ගුණතිලක ද පත් කරනු ලැබ සිටියේය. මොරවක් කෝරළේ සහ කොළොන්නේ මුදලිවරයා වූයේ හෙන්රිකස් ක්‍රිස්ටෝෆල් ද තොරයා අබේරත්න සිරිවර්ධනය. කඳුබොඩ පත්තුව දොන් ඩේවිඩ් විජය සිරිවර්ධන සෙනවිරත්න වන්නිගේ මුදලිවරයා යටතේ පැවැති අතර වැල්ලබඩ පත්තුව සඳහා දියෝනීසියස් ඒබ්‍රහම් දිසානායක මුදලිවරයා පත්කොට සිටියේය. තව ද වැල්ලබඩ පත්තුව සඳහා Titular මුදලිවරයකු වශයෙන් දොන් කොන්ස්ටන්ටයින් වික්‍රමසිංහ අමරසේකර ද නම් කරනු ලැබ ඇත.

1835 වන විට ද මහමුදලි තනතුර දොන් ඩේවිඩ් ජයතිලක අබේසිරිවර්ධන ඉලංගකෝන් විසින්ම හොබවනු ලැබීය. එහෙත් මේ වන විට මාතර තෝල්ක මුදලි ලෙස දියෝනීසියස් ලැම්බර්ට්ස් පෙරේරා වික්‍රමරත්න ඒකනායක ද කච්චේරියේ මුදලි ලෙස හෙන්රි මාර්ටින් තෙන්නකෝන් ද අනපත්තු මුහන්දිරම් ලෙස කරෝලිස් ඇන්ඩ්‍රියස් බණ්ඩාරනායක ද පත්වීම් ලබා සිටියහ.

වැලිගම් කෝරළේ සහ වැලිගම් තොටමුණේ මුදලි තනතුරු 1835 වන විට ද වෙනස් වී නොතිබුණේය. වැල්ලබඩ පත්තුවේ මුදලි තනතුර දැරුවේ ද 1823 දී එම තනතුර දැරූ මුදලිවරයාමය. එහෙත්, ගගබඩ පත්තුවේ මුදලි ලෙස 1835 වන විට ජොහාන් ලෙනාඩ් පිලිප්ස් විජේවර්ධන පණ්ඩිතරත්න පත්කරනු ලැබ සිටියේය. මොරවක් කෝරළේ සහ කොළොන්න වශයෙන් 1823 පැවැති මුදලි පේරුවෙන් මේ වන විට කොළොන්න ඉවත්කොට තිබුණු අතර මොරවක් කෝරළය සඳහා දොන් හෙන්ඩ්‍රිකස් පෙරේරා විජේසිංහ ගුණතිලක මුදලි පත් කර සිටියේය. කඳුබොඩපත්තුවේ මුදලි තනතුර මේ වන විට දරමින් සිටියේ දොන් ජොහැන්නස් රළිඟු විජේරත්න සිරිවර්ධනය.

1848 වාර්තාවලට අනුව, ඒ වනවිටත් මහමුදලි තනතුර සහ අනෙකුත් ප්‍රධාන තනතුරු දොන් ඩේවිඩ් ජයතිලක අබේසිරිවර්ධන ඉලංගකෝන් මුදලිතුමා විසින්ම හොබවනු ලැබීය. වැලිගම් කෝරළේ සහ වැලිගම් තොටමුණේ මුදලි තනතුරත් වැල්ලබඩපත්තුවේ මුදලි තනතුරත් 1823 සිටම නොවෙනස්ව පැමිණියේය. මොරවක් කෝරළේ සහ ගගබඩපත්තුවේ මුදලි තනතුරු 1835 දී එම තනතුරු හෙබවූ මුදලිවරුන් අතම පැවැතියේය.

එහෙත් කඳුබොඩපත්තුවේ මුදලි තනතුර සඳහා 1848 වන විට රිචර්ඩ් ෆර්ඩිනැන්ඩස් විජේරත්න ඔබේසේකර පත් කරනු ලැබ සිටියේය. තව ද, කච්චේරියේ මොහොට්ටි මුහන්දිරම් තනතුර සඳහා ජෝර්ජ් තිලකරත්න දිසානායක ද කච්චේරියේ මුහන්දිරම් තනතුරකට ඩේවිඩ් ජෝන් හෙන්ඩ්‍රිකස් ද සේරම් විජේසිරිවර්ධන ද පත් කොට සිටියහ. එහෙත්, කච්චේරි මුදලි සහ තෝල්ක මුදලි තනතුරුවල වෙනසක් නොවීය.

1853 වන විට, මහමුදලි දොන් ඩේවිඩ් ජයතිලක අබේසිරිවර්ධන ඉලංගකෝන් වෙනුවට ඒබ්‍රහම් කොර්නේලිස් අබේසිරිවර්ධන ඉලංගකෝන් මුදලිවරයා අනපත්තු මුදලි ලෙස පත්වන අතර ඔහුගේ නම මාතර ප්‍රභූවරුන් අතර ඉහළින්ම සඳහන්ව ඇත. ඔහු විසින් එතෙක් හෙබ වූ වැලිගම් කෝරළේ සහ වැලිගම් තොටමුණේ මුදලි තනතුර සඳහා ඩේවිඩ් ජෝන් හෙන්ඩ්‍රිකස් ද සේරම් විජේසිරිවර්ධන පත්කරනු ලැබ ඇත. මාතර කඩවත් හතරේ මුදලි තනතුර සහ කච්චේරියේ තෝල්ක මුදලි තනතුර දියෝනීසියස් නියඩෝරිස් ද සිල්වා රාජකරුණා වික්‍රමරත්න වෙත පවරා තිබේ. කච්චේරියේ මොහොට්ටි මුහන්දිරම් තනතුර වෙනස් නොවන අතර කච්චේරි මුහන්දිරම් තනතුර සඳහා ජෝන් වැලන්ටයින් ඩේවිඩ් අබේසිරිවර්ධන ඉලංගකෝන් පත්වේ.

ගඟබොඩපත්තුව, කඳුබොඩපත්තුව සහ වැල්ලබඩපත්තුව යන මුදලි පේරු 1853 වන විටත් මුලින් සිටි මුදලිවරුම පාලනය කළහ. එහෙත්, මොරවක් කෝරළයේ මුදලි ලෙස **අබේවර්ධන ජාසිංහ** 1853 වන විට අලුතින් පත් කරනු ලැබ සිටියේය. තව ද, ගඟබොඩපත්තුව සඳහා මුහන්දිරම්වරු ලෙස **දොන් ජොහැන්නස් ගුණරත්න සහ ඩේවිඩ් අර්නෝල්ඩිස් ද තොරයා අබේරත්න සිරිවර්ධන** පත්කරනු ලැබ සිටියහ.

1853න් මෙපිට කාලය තුළ මාතර දිස්ත්‍රික්කයේ තනතුරු හෙබ වූ පුහුන් පිළිබඳව විධාත් නිශ්චිත දින වකවානු සහිතව අපට කරුණු දැක්විය හැකිය. එහෙත්, මේ යුගයට අයත් මූලාශ්‍රවල පුහුන්ගේ නම් සඳහන් කිරීමේ දී අනුගමනය කර ඇත්තේ මුලකුරු සහිත වාසගම පමණක් භාවිත කිරීම බව ද මෙහි දී සැලකිය යුතුය. එහෙයින් සම්පූර්ණ නම දැක්විය හැකි අවස්ථාවල එම නමින් ද අනෙක් අවස්ථාවල මුලකුරු සහිත වාසගමින් ද එම පුහුන් මෙහි හඳුන්වා දී ඇත.

1853 ඔක්තෝබර් 1 වැනි දා සිට **ජේම්ස් ද සිල්වා විජයසිංහ** ගඟබොඩපත්තුවේ මුදලිවරයා ලෙස පත්කරනු ලැබීය. මාතර කච්චේරියේ තෝල්ක මුදලි ලෙස සහ මාතර කඩවත් නගරේ මුදලි වශයෙන් **ඇලෙක්සැන්ඩර් බර්තලමියුස් ද සිල්වා රාජකරුණා විතුමරත්න** 1854 මාර්තු 01 වැනි දා පත් කර ඇත. එම වසරේ සැප්තැම්බර් 01 දා සිට වැලිගම් කෝරළයේ මුදලි ලෙස **ජෝන් වැලන්ටයින් ඩේවිඩ් අබේසිරිවර්ධන ඉලංගකෝන්** පත් විය.

කඳුබොඩපත්තුවේ මුදලි ලෙස 1865 සැප්තැම්බර් 13 වැනි දා සිට **ජේ. ගුණරත්න** පත්කරනු ලැබූ අතර එම වසරේ ඔක්තෝබර් 01 දා සිට **ඩබ්ලියු බී. රත්නායක** මොරවක් කෝරළයේ මුදලි ලෙස පත්කරනු ලැබ ඇත. ගඟබඩපත්තුව, වැලිගම්කෝරළේ සහ වැල්ලබඩපත්තුවේ මුදලි තනතුරු 1850 ගණන්වල මුල සිට වෙනසක් වී නොතිබුණේය.

කඳුබොඩපත්තුවේ මුදලි තනතුර 1876 දී පුරප්පාඩු වුයෙන් එම වසරේ සැප්තැම්බර් 15 වැනි දා සිට එම තනතුර සඳහා **එන්.ඩී.එස්. විජේසිංහ** පත්කරනු ලැබිණි. 1878 අප්‍රේල් 11 වැනි දා සිට වැල්ලබඩ පත්තුවේ මුදලි ලෙස **එච්.ඩී තිලකරත්න** පත් විය. මොරවක් කෝරළයේ මුදලි පදවිය 1878 මැයි 1 වැනි දා සිට යළි වෙනස් වුයෙන් ඒ සඳහා ජේ.එන්. තිලකරත්න පත්කරනු ලැබී ය. ගඟබොඩපත්තුවේ මුහන්දිරම් ලෙස 1877 අගෝස්තු 15 වැනිදා සිට **ඩබ්ලියු.ආර්.එච්. පෙරේරා** පත්කර ඇත. **ඩී.ඒ. තිලකරත්න** 1879 ජනවාරි 01 වැනි දා වැලිගම් කෝරළයේ මුදලි තනතුරේ වැඩ බැලීමට පත් විය.

1880 දී යළි මුදලි තනතුරුවල වෙනසක් සිදු විය. එම වසරේ ජූලි 1 වැනි දා සිට වැලිගම්පත්තුවේ මුදලි ලෙස **එච්.ඩී. තිලකරත්න** ද වැල්ලබඩපත්තුවේ මුදලි ලෙස **ජේ.එෆ්. තිලකරත්න** ද තනතුරු ලැබූහ. මොරවක් කෝරළය සඳහා මුදලි වශයෙන් **එස්. සිල්වා** පත්කරනු ලැබුවේ ද එදින සිටය. කඳුබොඩපත්තුවේ සහ ගඟබොඩපත්තුවේ මුදලි තනතුරුවල වෙනසක් මෙවර සිදු නොවිය.

මොරවක් කෝරළයේ මුදලි තනතුර 1881 දී යළි පුරප්පාඩු විය. ඒ සඳහා 1882 ජනවාරි 01 වැනි දා සිට **එෆ්.ඩී.එස්. අබේසිරිවර්ධන** පත්කරනු ලැබීය. 1883 මාර්තු 01 වැනි දා සිට වැලිගම් කෝරළයේ මුදලි වශයෙන් **ජේ.එච්. ඉලංගකෝන්** පත් විය. වැල්ලබඩ පත්තුවේ මුදලි තනතුර හෙබ වූ **ජේ.එෆ්. තිලකරත්න** 1885 පෙබරවාරි මස සිට කච්චේරි මුදලි සහ ප්‍රධාන තෝල්ක මුදලි තනතුරට උසස් විය. ඔහුගෙන් පුරප්පාඩු වූ වැල්ලබඩපත්තුවේ මුදලි තනතුරට 1885 මාර්තු 25 වැනි දා සිට **ජේ.ඊ. වික්‍රමරත්න** පත්කරනු ලැබිණි. 1887 වර්ෂයේ දී කඳුබොඩපත්තුවේ මුදලි තනතුර පුරප්පාඩු වූයෙන් එම තනතුරේ වැඩබැලීම සඳහා එම වසරේ ජූලි 01 වැනි දා සිට ඩබ්ලියු. **ගුණරත්න** මුදලි පත් විය. 1888 ජුනි මාසයේ සිට එහි මුදලි තනතුරට පත් කළේ **එච්.ඩබ්ලියු.ජී. බණ්ඩාරනායක** මහතාය.

1890 ගණන්වල දී මුදලි තනතුරුවල වෙනස්කම් කීපයක් සිදු විය. වසර කීපයක්ම වැඩ බලන මුදලිවරයකු යටතේ තිබුණු කඳුබොඩපත්තුව සඳහා 1891 මාර්තු මාසයේ දී **සී.ඒ. වික්‍රමරත්න** මුදලිවරයා

ලෙස පත් කරනු ලැබිය. එහෙත්, 1892 දී යළිත් එම තනතුර පුරප්පාඩු වූයෙන් 1892 අගෝස්තු 01 වැනි දා **ටී.ආර්. තිලකරත්න** එහි වැඩබලන මුදලි ලෙස පත් විය. නැවත ස්ථිර මුදලිවරයකු කඳුබොඩපත්තුවට පත් කෙරුණේ 1895 ජනවාරි 2 වැනි දාය. **ජේ.ටී. ගුණතිලක** එම පත්වීම ලැබිය.

1892 ජූලි 27 වැනි දා **ජේ.ඒ. වික්‍රමරත්න** වැලිගම් කෝරළයේ මුදලි ලෙසත් **ඩබ්ලියු.සී. ඩයස්** වැල්ලබඩපත්තුවේ මුදලි ලෙසත් පත්වීම් ලැබූහ. ගඟබඩපත්තුවේ මුහන්දිරම්වරයකු ලෙස 1877 සිට කටයුතු කළ **ඩබ්ලියු. ආර්. එච්. පෙරේරා** 1895 සිට එහි මුදලිවරයා ලෙස සඳහන්ව ඇත.

මොරවක් කෝරළයේ මුදලි තනතුරට 1897 සැප්තැම්බර් 01 සිට **ටී.ඩී. සේරම්** ද වැල්ලබඩපත්තුවේ මුදලි තනතුරට 1898 ජූලි 15 දින සිට **ජී.ට්. වීරකෝන්** ද කඳුබොඩපත්තුවේ මුදලි තනතුරට 1899 අගෝස්තු 01 වැනි දා සිට **ඒ.ට්. පෙරේරා** ද පත්වීම් ලැබූහ.

මේ අනුව, දහනව වන ශතවර්ෂය අවසන් වන විට මාතර දිස්ත්‍රික්කයේ පාලනය කළෝ වැලිගම්පත්තුවේ ජේ.ඒ.ඩබ්ලියු. වික්‍රමරත්න, ගඟබඩපත්තුවේ ඩබ්ලියු.ආර්.එම්. පෙරේරා, මොරවක් කෝරළේ ටී.ඩී. සේරම්, වැල්ලබඩපත්තුවේ ඒ.ට්. පෙරේරා යන මුදලිවරුය.

මේ අතර 1871 සහ 1899 ඇති වූ ගම්සභා නීතිය අනුව මාතර සඳහා 1880 දී ගම්කාර්ය සභාවක් පිහිටුවා තිබිණි. එම ගම්කාර්ය සභාව සඳහා නියෝජිතයන් රජය විසින් නම් කරනු ලැබූ අතර ඒ සඳහා ඡන්දයෙන් නියෝජිතයන් පත්වූයේ 1921 තරම් පසුකාලයක සිටය. මෙතෙක් ඒ ඒ මුදලි පේරුව සඳහා සිටි මුදලිවරයා හැරුණ විට එම කොට්ඨාස සඳහා ගම්සභා නියෝජිතයකු ද මෙතැන් සිට පත් කරනු ලැබීය. මෙම ගම්කාර්ය සභාවේ මුල්ම සභාපතිවරයා වශයෙන් **ආර්.ආර්. දූනුවිල** 1880 ජුනි මාසයේ දී පත් කරනු ලැබ ඇත. වැල්ලබඩපත්තුව සඳහා **සී. ගුණතිලක** ද ගඟබඩපත්තුව සඳහා **එෆ්.ඩබ්ලියු. තිලකරත්න** ද මෙහි මුල්ම නියෝජිතයෝ වූහ. වැලිගම් කෝරළයේ නියෝජිතයා ලෙස වැඩ බැලීමට **ඩී.එෆ්. අබේරත්න** ද මොරවක් කෝරළයේ වැඩ බැලීම සඳහා **එච්.එල්. ගුණරත්න** ද පත්වීම් ලැබූහ.

1899 දී ගම්කාර්ය සභාව සඳහා නව නියෝජිතයෝ පත්වීම් ලදහ. වැලිගම් කෝරළයේ නියෝජිතයා වූ **ජී.ට්. ද එස්. ගුණරත්න** 1899 අප්‍රේල් 01 වැනි දා සිට එහි සභාපතිවරයා විය. වැල්ලබඩපත්තුව සඳහා **ට්.ආර්. සමරසේකර** එම වසරේ ජුනි 01 වැනි දා සිට ද, ගඟබඩපත්තුව සඳහා **එන්.ඒ. බණ්ඩාරනායක** එම වසරේ ජූලි 01 දා සිට ද පත් වූහ. 1899 සැප්තැම්බර් 01 වැනි දා සිට **එච්.ඩබ්ලියු. අලහකෝන්** මොරවක කෝරළයේ ගම්කාර්ය සභා නියෝජිතයා විය.

1823 සිට 1900 දක්වා මාතර දිස්ත්‍රික්කයේ ඉහළ නිලතල හෙබ වූ දේශීය පුහුන් පිළිබඳව මේ ලිපියෙන් විස්තර කරනු ලැබ ඇත. මෙහි සඳහන් කරනු ලැබූ පුද්ගලයන් හැරුණු විට, මුස්ලිම්වරුන් සඳහා ද විවිධ කුලවල ප්‍රධානීන් සඳහා ද දහනව වන ශතවර්ෂයේ දී වෙනම නිලතල වෙන්ව තිබුණි. මේ ලිපියේ දී එම ප්‍රධානීන් පිළිබඳව අවධානය යොමු නොකළ අතර මාතර දිස්ත්‍රික්කයේ පරිපාලනය භාරව සිටි ඉංග්‍රීසි ජාතික නිලධාරීන් ද, බමුණු ප්‍රධානීන්, පූජකයන්, ගුරුවරුන්, නීතිඥයන් සහ නොතාරිස්වරුන් වැනි එකල සමාජයේ අනෙකුත් පුහුන් පිළිබඳව ද මෙහි දී අවධානය යොමු නොවූ බව සඳහන් කළ යුතුය.


මූලාශ්‍රය:

Ceylon Almanac, 1823 onwards.

Ceylon Administrative reports, 1869 onwards.

Ceylon Blue Books, 1866 onwards.